# දැන්වීමයි

## සබරගමුව පළාත් සභාව

### සබරගමුව පළාත් අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

## සබරගමුව පළාතේ පළාත් සභා පාසල්වල පවතින ගුරු පුරප්පාඩු සඳහා ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 පන්තියේ I (අ) ශ්‍රේණියට උපාධිධාරීන් බඳවා ගැනීම - 2023

සබරගමුව පළාතේ පළාත් සභා පාසල්වල පවතින සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය ගුරු පුරප්පාඩු සඳහා ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථාව ප්‍රකාරව ශ්‍රී ලංකා ගුරු සේවයේ 3-1(අ) ශ්‍රේණියට උපාධිධාරීන් පාසල් පාදකව බඳවා ගැනීම පිණිස සබරගමුව පළාතේ ස්ථිර පදිංචි උපාධිධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. (දෙමළ මාධ්‍ය පුරප්පාඩු සඳහා පමණක් දීපව්‍යාප්තව අයදුම්පත් කැඳවනු ලැබේ.)

බඳවා ගැනීම පහත දක්වා ඇති ආකාරයට අවස්ථා 02ක් යටතේ වෙන් වෙන්ව සිදු කරනු ලැබේ. ඒ සඳහා අදාළ වන සම්පූර්ණ නිවේදන 02 සහ ආදර්ශ අයදුම්පත්‍ර සබරගමුව පළාත් අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවිය වන www.moe.sg.gov.lk හි පළ කර ඇත.

I. අ.පො.ස. (උසස් පෙළ) හා 13 වසරක අඛණ්ඩ අධ්‍යාපන වැඩසටහන යටතේ වන විෂයන් සඳහා.

II. ප්‍රාථමික හා අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විෂයන් සඳහා

ඒ අනුව අයදුම් කිරීමට අපේක්ෂිත සියලුම අයදුම්කරුවන් සබරගමුව පළාත් අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවිය වෙත පිවිස අදාළ සම්පූර්ණ නිවේදනයන්හි සඳහන් උපදෙස් සැලකිල්ලට ගෙන, දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍ර අනුව සකස් කරගත් අයදුම්පතක් යොමු කරන ලෙස මෙයින් නිවේදනය කර සිටිමි.

සැලකිය යුතුයි ;- කිසියම් අයදුම්කරුවෙකු සිය සුදුසුකම් මත ඉහත අවස්ථා 02ටම අයදුම් කිරීමට අපේක්ෂා කරන්නේ නම් ඔහු / ඇය ඒ සඳහා අදළ නිවේදනයන් ප්‍රකාරව වෙන් වෙන් වශයෙන් අයදුම්පත් දෙකක් ඉදිරිපත් කළ යුතුය.

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2023,11.13 වේ.

**බී.ඒ.සී.පී. බමුණුආරච්චි,**
**ලේකම්,**
**අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය,**
**සබරගමුව පළාත.**

**2023-10-13 වන දින,**
**සබරගමුව පළාත් සභාවේ,**
**අධ්‍යාපන තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේදී ය.**